# 3. ඉතිහාසය

## 10 ශ්‍රේණිය - ඉතිහාසය

### පැවරුම් අංක 01

I. රටක පාලනය වන ප්‍රධාන ආයතන තුන නම් කරන්න.
II. ඔබ ඉහත සඳහන් කළ ආයතන වල කාර්යයන් එක බැගින් සඳහන් කරන්න.
III. පුරාණ සෙල් ලිපිවලට අනුව රටේ පාලනය මෙහෙය වන ආයතන පහත දැක්වේ. ඒවා මොනවාදැයි හඳුන්වන්න.
   1. එක්තැන් සමිය
   2. වත්හිමියන් වදාල
   3. සභාව
IV. පැරණි සමාජයේ නීතිමය කටයුතු සඳහා රාජ්‍ය නිලධාරින් සහභාගී වූ බව කරුණු දෙකක් මගින් සනාථ කරන්න.
V. අතීත රාජ්‍ය පාලනයේ දී මහ ලේකම්ට පැවරුණු කාර්යයන් දෙකක් සඳහන් කරන්න.

### පැවරුම් අංක 02

(1). දසගම් ඇත්තන් ලෙස හැඳින්වූයේ කවුරුන්ද?
(2). පරිපාලන කටයුතු වලදී රජු විසින් මහජනතාවගේ සුභ සිද්ධිය සඳහා සෞඛ්‍ය පහසුකම් නගා සිට වූ ආකාරය නිදහස් දෙකක් අයුරින් පැහැදිලි කරන්න.
(3). පැරණි රජවරු අසල්වැසි රටවල් මෙන්ම දුර රටවල් සමඟ සුහුදශීලී සබඳතාවක් පැවැත් වූ බව කරුණු දෙකක් මගින් සනාථ කරන්න.

### පැවරුම් අංක 03

(1). පැරණි සමාජයේ පැවති කර්මාන්ත තුනක් ලියන්න.
(2). පහත සඳහන් වචනවල තේරුම් ලියන්න.
- ගිණි යාතිකාව -
- නවදැලි හේන -
- කනත්ත -
- දඬු වැට -
- හැලි කටා -

(3). පැරණි ශ්‍රී ලංකාවේ වී වගාව හා සත්තව පාලනය සාර්ථකව සිදු වූ බව නිදසුන් දෙකක් මගින් පැහැදිලි කරන්න.
(4). පුරාණයේ මෙරට කර්මාන්ත දියුණුව පැවැති බවට උදාහරණ තුනක් පුරාවිද්‍යාත්මක සාක්ෂි ඇසුරින් පැහැදිලි කරන්න.

## පැවරුම් අංක 04

(1). පහත දැක්වෙන වචන සඳහන් වී ඇති සෙල් ලිපි පිහිටි ස්ථාන ලියා දක්වන්න.

I. අන්තේමාසික -

II. වසවසිත

III. ලපන

IV. සදිවිහරිය

(2). පැරණි සමාජයේ සාහිත්‍ය හා රසාස්වාදය දියුණු මට්ටම් පැවැති බව නිදසුන් දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න.

(3). පැරණි සමාජය තුළ විවිධ ජාතීන් ඉතා සහජීවනයෙන් කටයුතු කළ බව උදාහරණ තුනකින් දක්වන්න.

(4). I. ශ්‍රී ලංකාවේ පැරණි සමාජය තුළ භාවිත වූ පැරණි වෙළඳ වරායයන් තුනක් නම් කරන්න.

II. එදා සමාජයේ විවිධ ආගම් තිබු බවට ලැබෙන සාක්ෂි දෙකක් ලියන්න.

III. පැරණි සමාජයේ ගුරුවරුන් සතු කාර්යයන් හතරක් සඳහන් කරන්න.